දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை

[redacted]

1 වන මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට, 1ஆம் மாடி, மாகம் றுகுணுபுர நிர்வாக கட்டிடத் தொகுதி, சிறிபோபுர, ஹம்பாந்தோட்டை. 1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

"සෞභාග්‍යයේ දැක්ම" "For a prosperous future"

මගේ අංකය / எனது இலக்கம் / My No: DSH/DPS/07/DCC/වාර්තා/2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your re No:
දිනය / திகதி / Date: 2025.03.07

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - 2025.*02.28*</u>**

*2025.02.28* වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතනවල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථාවලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03. ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය දින 14 ක් ඇතුළත මා වෙත *DCC Hambantota WhatsApp* වෙත හෝ *dpshambantota@gmail.com* වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04. තවද, මෙම වාර්තාව *www.hambantota.dist.gov.lk* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

පිටපත්:-
01 දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමා - කරු.දැ.ගැ.ස.
02 හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා -කරු.දැ.ගැ.ස
03. ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
04. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස

දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / District Secretary - 047 2256235
අතිරේක දිස්ත්‍රික් ලේකම්(පාලන) / மேலதிக மாவட்ட செயலாளர் (நிர்வாகம்) / Additional District Secretary (Admin) - 047 2256232
අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්) / மேலதிக மாவட்ட செயலாளர் (காணி) / Additional District Secretary (Land) - 047 2256002
ප්‍රධාන ගණකාධිකාරී / கணக்காளர் / Chief Accountant - 047 2256246
අධ්‍යක්ෂ (කෘෂිකර්ම) / பணிப்பாளர் (விவசாயம்) / Director (Agriculture) - 047 3628890
අධ්‍යක්ෂ (සැලසුම්කරණ) / பணிப்பாளர் (திட்டமிடல்) / Director (Planning) - 047 2256234
සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மாவட்ட செயலாளர் / Assistant District Secretary - 047 2256945
පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer - 047 2256285
කාර්යාලය / அலுவலகம் / Office
ෆැක්ස් / தொலை நகல் / Fax - 047 2256235, 047 2256247
ඊ මේල් / மின்னஞ்சல் / email : moha.dist.hambantota@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site : www.hambantota.dist.gov.lk

SCAN AnyScanner

**හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම**

**2025.02.28**

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපතිතුමන් වෙනුවෙන් පළාත් සභා හා පළාත් පාලන ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.02.28 වන දින පෙ.ව. 9.30ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වන ලදී.

දිස්ත්‍රික් ලේකම්තුමන් විසින් රැස්වීමට සහභාගී වූ දේශපාලන නායකත්වය සහ අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව අතිගරු ජනාධිපතිතුමන් විසින් දැනුම් දෙන ලද ගම් මට්ටමින් වන සංවර්ධන කටයුතු සඳහා සියලුම නිලධාරීන්ගේ සහාය අපේක්ෂා කරන බව දැනුම් දෙන ලද අතර, කණ්ඩායමක් ලෙස හම්බන්තොට දිස්ත්‍රික්කයේ සියළුම නිලධාරීන් එක්ව රජය සැලසුම් කර ඇති පරිදි ආර්ථික ප්‍රවාහය ගම තුළට කාන්දු කර වීම සඳහා ග්‍රාමීය සංවර්ධනය කඩිනම් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙන ලදී. ගරු සභාපතිතුමන් හට මෙම අවස්ථාවට සම්බන්ධ වීමට නොහැකි වීම හේතුවෙන් ගරු සභාපති තුමන් වෙනුවෙන් පළාත් සභා හා පළාත් පාලන ගරු නියෝජ්‍ය ඇමතිතුමන් වෙත රැස්වීමේ ඉදිරිකටයුතු කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලදී. එහිදී පළමු වෙන්ම Clean Sri Lanka වැඩසටහන යටතේ ජාතික වැඩසටහනට සමගාමීව හම්බන්තොට වෙරළ තීරය පිරිසිදු කිරීම් සඳහා සම්බන්ධ වෙමින් විශාල සහයෝගයක් ලබාදීම පිළිබඳ සියලුම නිලධාරීන් හට විශේෂ ස්තූතිය පිරිනමමින් ඉදිරි වැඩ කටයුතු සඳහා ද සියල්ලන්ගේම සහාය අවශ්‍ය බව සඳහන් කරමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

පසුගිය වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීමෙන් අනතුරුව අඩුපාඩු කිසිවක් නොවූ බැවින් එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලද අතර අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ. අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1 | පසුගිය වාර්තාවෙන් පැන නැගුණු ගැටළු | | | |
| 1.1 | සූරියවැව මීගහජඳුර නා සෙවන පොල් ඉඩම සම්බන්ධව | මෙම ඉඩම සම්බන්ධයෙන් මැනුම් කටයුතු පිළිබඳ ගැටළුවක් මතුව ඇති බවත් ඉඩමෙන් වැඩි භූමි ප්‍රමාණයක් සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වන බවත්, ඉතිරි ප්‍රමාණය සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වන බවත් කරුණු ඉදිරිපත් විය. තවද ගංගාරාම විහාරස්ථානයෙන් මෙම ඉඩම සඳහා නිදහස් බලපත්‍රයක් ලබා දෙන ලෙස ඉල්ලීම කර ඇති අතර ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර දීර්ඝ කාලීන බලපත්‍රයක් ලබා දීමට අවසර ලබා දී ඇත. ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුවේ සාකච්ඡා කර 2007.08.20 දිස්ත්‍රික් ඉඩම පරිහරණ කමිටුව වෙත යොමු කිරීමෙන් අනතුරුව එහි එකඟතාවය මත වගා කිරීම් සිදු කර ඇති බවත්, ඒ අනුව බලපත්‍ර සකස් කිරීමේ ක්‍රියාවලිය සිදු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>දිස්ත්‍රික්කයේ බොහෝ විහාරස්ථාන තිබියදීත් පුද්ගලික පාර්ශවයක් වෙත ලබා දෙන ලද ඉඩමක් සඳහා යුධ හමුදා නිලධාරීන් දීර්ඝකාලීනව ඉඩමේ සංවර්ධන කටයුතු සඳහා සේවයේ යෙදවීම සම්බන්ධයෙන් සියලු විස්තර ඇතුළත් වාර්තාවක් ලබා දෙන ලෙසට අදහස් ඉදිරිපත් විය. | මෙවැනි ගැටලු සම්බන්ධයෙන් රාජ්‍ය මට්ටමින් මැදිහත් වී ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බවත් , මෙම ඉඩමේ සේවය සඳහා යෙදවූ හමුදා නිලධාරීන් පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් දැනුවත් කිරීමට තීරණය කරන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>සේනාංකාධිපති (12 වන සේනාංකය)<br><br>ප්‍රාදේශීය ලේකම් සූරියවැව<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී - තංගල්ල |
| 1.2 | වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බැදිගම වසමේ පිහිටි පොල් ඉඩම | ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයට අයත් අක්කර 01යි රූඩ 01යි පර්.21.3 වන මෙම ඉඩම තිස් අවුරුදු බදු පදනම යටතේ නා සෙවන ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය වෙත පවරා ඇති බවටත්, 2013.01.01 සිට 2024.12.31 දක්වා බදු අයකර ගෙන ඇති | මෙවැනි ගැටලු සම්බන්ධයෙන් රාජ්‍ය මට්ටමින් මැදිහත් වී ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බවත් , මෙම ඉඩමේ | දිස්ත්‍රික් ලේකම්<br><br>ජ්‍යෙෂ්ඨ පෙලිස් අධිකාරී - තංගල්ල |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| | | | | |
|---|---|---|---|---|
| | | බවටත් කරුණු ඉදිරිපත් කරන ලදී. | සේවය සඳහා යෙදවූ හමුදා නිලධාරීන් පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් දැනුවත් කිරීමට තීරණය කරන ලදී. | ප්‍රාදේශීය ලේකම් වීරකැටිය<br>අධ්‍යක්ෂ, ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය |
| 1.3 | සූරියවැව හබරත්තවල මාර්ගයේ කොටසකට විදුලිය නොමැති වීම | මෙම ප්‍රදේශයට විදුලි සැපයුම ලබා දීම සඳහා ට්‍රාන්ස්ෆෝමරයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය විදුලි බල මණ්ඩලයේ සැළසුම් අංශය වෙත දන්වා ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂවක් මේ වන විටත් ආරම්භ කර ඇති බවත් ඊට අදාළ නිර්දේශ සහ ප්‍රතිපාදන ලබා දීමෙන් පසු විදුලි සැපයුම ලබා දිය හැකි බවට කරුණු ඉදිරිපත් කරන ලදී. | සති දෙකක් ඇතුළත ඇස්තමේන්තුවක් ලබා දෙන ලෙස උපදෙස් ලදී. | ප්‍රධාන ඉංජිනේරු හම්බන්තොට |
| 02 | 2025.02.28 දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කළ කරුණු | | | |
| 2.1 | 2025 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් සම්බන්ධ දැනුවත් කිරීම. | *විමධ්‍යගත අයවැය වැඩසටහන*<br>මෙම වැඩසටහන යටතේ රු.මි. 80 ක පමණ ප්‍රතිපාදන වෙන්කර දී ඇති බවත් එම ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘතියක් හඳුනාගැනීමේදී ආහාර සුරක්ෂිතතාව ජීවනෝපාය නගාසිටුවීම,<br>අගයදාම සංවර්ධනය, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ව්‍යවසායකත්ව සංවර්ධනය , නව තාක්ෂණය හඳුන්වාදීම කෙරෙහි අවධානය යොමු කල යුතු බවත් එක් ව්‍යාපෘතියක අවම වටිනාකම රු.මි. 1 ක් වියයුතු බවත් දැනුම් දෙන ලදි.<br>තවද, රු.මි. 80 ක ප්‍රතිපාදන දිස්ත්‍රික්කයේ ජනසංඛ්‍යාව හා භූමි ප්‍රමාණය පදනම් කරගනිමින් සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර සාධාරණ පදනමක් යටතේ බෙදාදීමට කල යෝජනාව පරිදි තංගල්ල , අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත රු.මි. 10 බැගින්ද බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත රු.මි. 7 හා ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට රු.මි. 5 ක් ද සමගින් ඉතිරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8 සඳහා ( කටුවන, වලස්මුල්ල, වීරකැටිය, අඟුණකොළපැලැස්ස, හම්බන්තොට, සූරියවැව, තිස්සමහරාම සහ ලුණුගම්වෙහෙර) රු.මි. 6 බැගින්ද වෙන් කර දෙන ලදි.<br>ඒ අනුව, එක් එක් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අනුමත කර තිබූ යෝජනා 49ක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.<br>එමෙන්ම, චක්‍රලේඛයේ පරිදි ව්‍යාපෘති 2025 නොවැම්බර් 15දිනට පෙර අවසන් කලයුතු බව දැනුම් දී ඇති බවත් එකී දිනයට පෙර ව්‍යාපෘති අවසන් කර ගැනීම සඳහා සියළු දෙනාගේ සහාය අවශ්‍ය බවත් ඉල්ලා සිටින ලදි. | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් හඳුනා ගනිමින් අනුමත කර තිබූ යෝජනා සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර චක්‍රලේඛ පරිදි සියළුම කටයුතු අවසන් කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)<br>දිසත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 2.2 | 2025 වර්ෂයේ දකුණු පළාත් සභාව මගින් හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් | දකුණු පළාත් සභාවේ පළාත් නිශ්චිත හා උපමාන පාදක යටතේ අමාත්‍යාංශ 5 නියෝජනය කරමින් හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන සියළුම වැඩසටහන් පිළිබඳ වාර්තාව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.<br>එමෙන්ම, මෙම සියළුම ව්‍යාපෘති සඳහා දළ ඇස්තමේන්තුවක් පමණක් ඉදිරිපත් කර ඇති බවත් | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී. | ප්‍රධාන ලේකම් දකුණු පළාත් සභාව<br>දකුණු පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන් |

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



SCAN AnyScanner

| | | | | |
|---|---|---|---|---|
| | දැනුවත් කිරීම | ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේදී ප්‍රතිපාදන ඉතිරිවීම් වේ නම් ඒවා එම කොට්ඨාසවලට වෙනත් ඵලදායී කටයුතු සඳහා යොදා ගැනීමට හැකියාව පවතින බවත් දන්වන ලදී.<br>තවද, මෙම අමාත්‍යාංශ 5 මඟින් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සිදුකරන සංවර්ධන වැඩසටහන් එම සම්බන්ධීකරණ කමිටුවල දැනගැනීමට සහ අනුමැතිය සඳහා වෙන වෙනම යොමු කර ඇති බවත් දන්වන ලදී.<br>විමධ්‍යගත අයවැයයෝජනා යටතේ ලැබෙන මුදල් ප්‍රතිපාදන මගින් ව්‍යාපෘති තෝරා ගැනීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලදී ම පළාත් සභා ව්‍යාපෘති යෝජනා සහ මධ්‍ය රජයේ ව්‍යාපෘති යෝජනා ද්විකරණය නොවන ලෙස තෝරා ගැනීම සිදු කළ යුතු බවත්, ඇස්තමේන්තු සකස් කිරීම සඳහා තාක්ෂණ නිලධාරීන්ගේ හිඟයක් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය.<br>ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලැබෙන තෙක් මූලික කටයුතු සඳහා පෙර සූදානමක් ඇතිව කටයුතු කිරීම සුදුසු බවට අදහස් දක්වන ලදී. | | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්) දකුණු පළාත<br><br>දිසත්‍රික්කයේ සියළුම ආයතන ප්‍රධානීන් |
| 2.3 | සූරියවැව බස් නැවතුම්පොළ පොදු වැසිකිළි පද්ධතිය සූරියවැව ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සම්බන්ධව. | මෙම වැසිකිළි පද්ධතිය අබලන් තත්ත්වයේ පවතින බැවින් මගී ජනතාවට පහසුකම් සැපයීම ගැටළුවක්ව පවතින බවත්, ටෙන්ඩර් ක්‍රියාවලියකට යාම සඳහා ටෙන්ඩර්කරුවන් සොයා ගැනීමේ දුෂ්කරතා ඇති බැවින් ආදායමින් 40% ක මුදලක් දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත ගෙවීම අපහසු බවට කරුණු ඉදිරිපත් කරන ලදී. | මෙම ආයතන දෙක එකම අමාත්‍යාංශයක් යටතේ බවතින බැවින් ආයතන දෙක එක්ව සාකච්ඡා කර විසඳුමකට එළඹ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | සභාපති දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය<br><br>ලේකම් සූරියවැව ප්‍රාදේශීය සභාව |
| 03 | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් ඉදිරිපත් වී ඇති යෝජනා | | | |
| 3.1 | ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මගින් ඉදිරිපත් වී ඇති යෝජනා | | | |
| | ගජසමරගම ඉඩම්ලාභීන්ට ඉඩම් ඔප්පු ලබා ගැනීමට නොහැකි වීම . | මෙම ගම්මානවලින් කොටසක් ප්‍රාදේශීය ලේකම් සතු ඉඩම්වල ද, තවත් කොටසක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල ද, පවතින බවත් ප්‍රාදේශීය ලේකම් සතු ඉඩම්වල පදිංචි නිවාස හිමියන්ගෙන් කොටසකට මේ වන විටත් ඔප්පු ලබා දීමට කටයුතු කර ඇති බවත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින ඉඩම්වලට ඔප්පු ලබා දිය හැකි වන්නේ එම ඉඩම් ප්‍රාදේශීය ලේකම් වෙත පැවරීමෙන් පසුව බවටත් අදහස් ඉදිරිපත් විය.<br><br>එසේම නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ලබා දී ඇති ඉඩම් සඳහා ඔප්පු ලබා දීමට නම් ඉඩම් නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමෙන් අනතුරුව සිදු කළ යුතු බවත් එය ඉතා දීර්ඝ කාලයක් ගත වන ක්‍රියාවලියක් බවත්ප්‍රකාශ කරන ලදී. ප්‍රාදේශීය ලේකම් වෙත මෙම ඉඩම් පවරා දී ඒ අනුව ඉඩම් හිමියන්හට ඔප්පු ලබා දීමට හැකි වන්නේ නම් ඒ සඳහා නිවාස සංවර්ධන අධිකාරියේ විරුද්ධත්වයක් නොමැති බවට ද කරුණු ඉදිරිපත් කරන ලදී. | මෙවැනි ගැටලු දිස්ත්‍රික්කය පුරාවට පවතින බැවින් අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්) ගේ මූලිකත්වයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් සහ නිවාස සංවර්ධන අධිකාරියද එක්ව සාකච්ඡා කර අවසන් වාර්තාව ඊළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දෙන ලදී.<br><br>නිවාස සංවර්ධන අධිකාරියේ ඉඩම්වල දැනට පදිංචි පුද්ගලයින් සම්බන්ධ සමස්ථ වාර්තාවක් සහ නිවාස හිමියන්ගෙන් අයකර ගැනීම් සම්බන්ධ මාසික වාර්තාවක් ද ඊළඟ කමිටුවට ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්)<br><br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>දිස්ත්‍රික් කළමණාකරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| 3.2 | බෙලිඅත්ත ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මගින් ඉදිරිපත් වී ඇති යෝජනා | | | |
| 3.2.1 | බෙලිඅත්ත දිසා රෝහලේ | බෙලිඅත්ත දිසා රෝහලේ අනුමත වෛද්‍යවරුන් සංඛ්‍යාව 09 ක් වුවත් මේ වන විට රෝහලේ සේවය | බෙලිඅත්ත ප්‍රාදේශීය රෝහලක් ලෙස අනුමත | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |



විමල් ඉන්දුජිත් ද සි...
දිස්ත්‍රික් ලේකම් / දිසාප...
හම්බන්තොට

| | | | | |
|---|---|---|---|---|
| | වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු සම්බන්ධව | කරනුයේ වෛද්‍යවරුන් 04 දෙනෙකු බවට අදහස් ඉදිරිපත් විය.<br>බෙලිඅත්ත දිසා රෝහලක් ලෙස නොව ප්‍රාදේශීය රෝහලක් ලෙස අනුමත වෛද්‍යවරු සංඛ්‍යාව 06ක් විය යුතු බවත් , මේ වන විට වෛද්‍යවරුන් 05 දෙනෙකු සහ ලියාපදිංචි වෛද්‍යවරයකු සමඟ වෛද්‍යවරුන් 06ක් සිටින බැවින් එය ප්‍රමාණවත් බවට කරුණු ඉදිරිපත් කරන ලදී. | වෛද්‍යවරුන් සංඛ්‍යාව 06 ක් බව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | |
| 3.2.2 | හ/ පුවක්දණ්ඩාව ධම්මපාල බාලිකා ජාතික පාසල මිශ්‍ර පාසලක් බවට පත් කිරීම සම්බන්ධව | මෙම පාසල මිශ්‍ර පාසලක් බවට පත්කිරීම සඳහා කිසිවකුගේ විරෝධතාවයක් නොවූ බැවින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලැබී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. | ඒ සඳහා අනුමැතිය ලබා දුන් අතර තීරණය අධ්‍යාපන අමාත්‍යාංශයට දැන්විය යුතු බව තීරණය විය. | දිස්ත්‍රික් ලේකම් -හම්බන්තොට<br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල<br>ප්‍රාදේශීය ලේකම් බෙලිඅත්ත |
| 3.3 | ඕකෙවෙල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මගින් ඉදිරිපත් වී ඇති යෝජනා | | | |
| 3.3.1 | යටිගල පහළ ග්‍රාම නිලධාරී වසමේ මාවතුගොඩ පාලම ඉදිකර ගැනීම සම්බන්ධව | මෙම පාලම 2023.11.02 දින පැවති ගංවතුරින් සම්පූර්ණයෙන්ම හානියට පත්ව ඇති බවත්, පවුල් 17ක් සඳහා ඇති එකම ප්‍රවේශ මාර්ගයද මෙය වන බවත්, එම ස්ථානය මේ වන විට විශාල අවදානම් තත්වයක පවතින බැවින් පාසල් දරුවන් සහ ප්‍රදේශවාසීන් දැඩි ලෙස අපහසුතාවයට පත්ව ඇති බවට කරුණු ඉදිරිපත්වන ලද අතර පාලම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන නොමැති වීමෙන් පාලමේ ඉදිකිරීම් කටයුතු නතර වී ඇති බවට අදහස් දක්වන ලදී.<br>මෙම පාලම සකස් කිරීම සඳහා රුපියල් මිලියන 8.5 ක ඇස්තමේන්තුවක් සකස් කර දකුණු පළාත් ආණ්ඩුකාරතුමන් වෙත ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කරන ලදී .එහිදී මෙම ගැටලුව සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමන් දැනුවත් කල හැකි බව ආණ්ඩුකාර ලේකම්තුමන් විසින් දන්වන ලදී.<br>තවද, දිස්ත්‍රික්කය තුළ වැඩ ආරම්භකර අතරමඟ නතරකර ඇති පාලම් 13ක් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය.<br>මීට අමතරව දිස්ත්‍රික්කය තුළ අනවශ්‍ය ස්ථානවල ඉදිකර ඇති පාලම් ගලවා අවශ්‍ය ස්ථානවල සවිකිරීමේ හැකියාව පවතින්නේ නම් එම කටයුතු සිදු කිරීමට බාධාවක් නොමැති බවද ප්‍රකාශ කරන ලදී. ඒ අනුව, ඕකෙවෙල කොට්ඨාසයේ පාරක් නොමැතිව ඉදිකරන ලද පාලම සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙසද දන්වන ලදී. | දිස්ත්‍රික්කය තුළ වැඩ ආරම්භ කර අතරමග නතරකර ඇති පාලම් සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් දළ ඇස්තමේන්තු සකස් කර දෙන ලෙසත්, එය අදාළ අමාත්‍යතුමන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම කරන බවට දැනුම් දෙන ලදී. | ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය<br>දිස්ත්‍රික් ඉංජිනේරු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |
| 3.3.2 | සූම්හිරිගම ප්‍රජා ජල ව්‍යාපෘතිය පිහිටි භූමිය වෙන් කර ගැනීම සම්බන්ධව | සිසිල ප්‍රජා ජල ව්‍යාපෘතිය රජයේ ඉඩමක ස්ථාපිත කර ඇති බවත්, මෙතෙක් එම භූමිය වෙන් කර දී නොමැති බවත්, ව්‍යාපෘතිය වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීම අත්‍යවශ්‍ය කාරණයක් වුවද භූමිය වෙන්කර දී නොමැති බැවින් වැට ඉදිකිරීමට නොහැකි වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | මෙම ගැටලුව මිනින්දෝරු අධිකාරියේ වීරකැටිය ප්‍රාදේශීය කාර්යාලය වෙත යොමු කර කඩිනමින් සිදු කරන ලෙසට උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් ඕකෙවෙල<br>දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී |

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
[illegible]බන්තොට



SCAN AnyScanner

| | | | | |
|---|---|---|---|---|
| 05 | වෙනත් කරුණු | | | |
| 5.1 | මිහිඳුපුර, පලපොත බටහිර,ඔවිලාන,මීගහ වල, කුඩාහීල්ල නැගෙනහිර යන ග්‍රාම නිලධාරී වසම් සම්බන්ධ පලපොත සෞඛ්‍ය මධ්‍යස්ථාන පාරට බස් රථයක් ලබා ගැනීම සම්බන්ධව | ග්‍රාම නිලධාරී වසම් 05ක් සහ ඊට යාබද වසම් ගණනාවක්ද සම්බන්ධවන මෙම මාර්ගයට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විවිධ ආයතනයන්හි සේවය කරන අය සඳහාත් , දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පහසු කර ගැනීම සඳහාත්, මහජනතාවගේ එදිනෙදා ජීවිතයේ පෙදු ප්‍රවාහන පහසුව සඳහාත් මෙම මාර්ගයට බස් රථයක් ලබා දෙන ලෙසට ඉල්ලීම කරන ලදී. | අවශ්‍ය කටයුතු සිදුකරන බවට දැනුම් දෙන ලදී. | සභාපති දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 5.2 | වාඩිය යක්වැව මාර්ගය පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දීම සම්බන්ධව | මෙම මාර්ගය බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව සහ වීරකැටිය ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශ දෙක එකට යා කරන ගම් මායිම් මාර්ගයක් වන අතර කාපට් යොදා සංවර්ධනය කර ඇතත් ක්‍රමවත් කාණු පද්ධතියක් සකස් කර නොමැති බැවින් ප්‍රාදේශීය සභා මට්ටමින් නඩත්තු කිරීමේ දැඩි අපහසුතාවයක් පවතින බවත් සභාවල එකඟතාව මත ,එය පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා දෙන ලෙසට කරුණු ඉදිරිපත් කරන ලදී. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පැවරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දෙන ලදී. | දිස්ත්‍රික් ඉංජිනේරු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>පළාත් පාලන සහකාර කොමසාරිස්<br>ලේකම් ප්‍රාදේශිය සභාව බෙලිඅත්ත |
| 5.3 | යටාලතිස්ස පෝෂිත පාසලේ පන්ති කාමර 4න් පන්ති කාමර 03ක පමණක් සිසුන් දෙබරවැව ජාතික පාසලට ඇතුළත් කර ගැනීම සම්බන්ධව | දෙබරවැව ජාතික පාසලේ පෝෂිත පාසලක් වන යටාලතිස්ස පාසලේ පන්ති කාමර 03ක පමණක් දරුවන් ජාතික පාසල වෙත ඇතුළත් කර ගැනීම දීර්ඝ කාලයක් තිස්සේ සිදුවන ක්‍රියාවලියක් බවත්, ජාතික පාසලට ඇතුළත් වීමට නොහැකි දරුවන්හට වෙනත් පාසල් කරා යාමට සිදුවන බවටත් කරුණු ඉදිරිපත් විය.<br>යටාලතිස්ස පාසලේ සියලු දරුවන්ට සහ ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන් සඳහා දෙබරවැව ජාතික පාසලට ඇතුළත් වීමට අවස්ථාව ලබා දිය යුතු බවත්, යටාල තිස්ස පාසලට 1 ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුළත් කිරීමේදී ගැසට් පත්‍රයේ සඳහන් පරිදි පෝෂිත ගම්මානවල දරුවන් පමණක් පාසලට ඇතුළත් කිරීමට විශේෂ අවධානයක් යොමු කළ යුතු බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් අදාළ පාර්ශව එක්ව කඩිනම් සාකච්ඡාවකින් පසුව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 5.4 | අඟුණකොළපැලැස්ස මහානාග විද්‍යාලයේ ඇතිවී තිබෙන ගැටළු සම්බන්ධව | මෙම පාසලේ කාලයක් තිස්සේ පවතින අර්බුදයක් හේතුවෙන් කළාප කාර්යාලය මගින් පරීක්ෂණයක් සිදු කර නිර්දේශ ලබා දීතිබුණ ද එම නිර්දේශ ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් සතියක් ඇතුළත අමාත්‍යංශය වෙත යොමු කර නිර්දේශ ක්‍රියාත් මක කිරීම සඳහා වැඩපිළිවෙළක් සකසා ගැනීමට තීරණය විය. | කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල |
| 5.5 | කුඩාවැල්ල ග්‍රාම නිලධාරී වසම් කිහිපයක පවතින ජල ගැලීම් ගැටළු | 2025 වර්ෂය සඳහා ව්‍යාපෘති යෝජනා ආපදා කළමනාකරණ අමාත්‍යංශය වෙත මේ වන විටත් ඉදිරිපත් කර ඇතත්, මෙය අත්‍යවශ්‍ය කටයුත්තක් බැවින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගනිමින් ව්‍යාපෘති යෝජනාවක් සකස් කර අමාත්‍යංශය වෙත යොමුකිරීමට හැකි බවට අදහස් ඉදිරිපත් කරන ලදී.<br>ඇල මාර්ග 2 ක් සහ භූගත නළ මාර්ගයක් ලෙස කොටස් 03ක් යටතේ මේ සඳහා ඇස්තමේන්තු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සකස් කර ඇති බවත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශයේ ඉඩම් හිමියන්ගේ එකඟතාවයද ලැබී ඇති බවත්, හානිවන දේපල සම්බන්ධයෙන් ද වෙනම ඇස්තමේන්තුවක් | මෙය කඩිනමින් සිදුකල යුතු බව හා අදාල ව්‍යාපෘති යෝජනාවක් සකස් කර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කරන ලෙසත් උපදෙස් දෙන ලද අතර<br>ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී | ප්‍රාදේශීය ලේකම් තංගල්ල<br>දිස්ත්‍රික් ඉංජිනේරු පළාත් වාරිමාර්ග<br>සහකාර අධ්‍යක්ෂ, ආපදා කළමනාකරණ ඒකකය |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| | | | | |
|---|---|---|---|---|
| | | සකස් කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී. | | |
| 5.6 | කිරින්ද වෙරලාශ්‍රිතව ඇති අනවසර ඉදිකිරීම සම්බන්ධව | කිරින්ද පොලිසිය ඉදිරිපිට වෙරලාශ්‍රිත ප්‍රදේශය තුළ දිගින් දිගටම අනවසර ඉදිකිරීම් සිදුවන බැවින් ප්‍රාදේශීය ලේකම් සහ පොලිස් ස්ථානාධිපතිතුමන් හට නිරන්තරයෙන් එම ස්ථාන කරා යාමට සිදු වන බවත් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු මෙ සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කරමින් කටයුතු කළ යුතු බවත්, එම ස්ථානයේ අනවසර ඉදිකිරීම් සිදු කරන මුල් අවස්ථාවේදී ඊට අදාළ නීතිමය ක්‍රියා මාර්ග ගනිමින් එම ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතු බවට කරුණු ඉදිරිපත් විය.<br>මෙම ස්ථානයේ අනවසර ඉදිකිරීම් 05ක් සිදු කර ඇති බවත් ඉන් 03ක් සඳහා රාජකාරි අවසන් කර ඇති බවත් දන්වන ලදී. ඉතිරි අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා යොමු කර ඇති බවත් එම අනුමැතිය ලැබීමෙන් පසු ඉවත් කිරීම් කටයුතු සිදු කළ හැකි බවත් දන්වන ලදී.<br><br>තවද කිරින්ද වරායේ අධික ලෙස වැලි ගොඩ ගැසීම නිසා සුළං සමඟ වැලි ගසා ඒම හේතුවෙන් අවට ප්‍රදේශයේ ජනතාවට සිය නිවෙස් තුළ පවා සිටීමට නොහැකි තත්ත්වයක් උද්ගතව ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>මෙසේ වැලි ගොඩ ගැසීමේ දී ධීවර වරාය සංස්ථාවෙන් වැලි විකුණා ඇති බවත් වර්තමානයේදී වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් එම කටයුතු කිරීමට ඉඩ නොදෙන බවට කරුණු ඉදිරිපත් විය. | මෙම ඉදිකිරීම් සම්බන්ධයෙන් විස්තර ඇතුළත් වාර්තාවක් (ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අතුල වෙළඳගොඩ මැතිතුමාහට) ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදී.<br><br>ධීවර සංස්ථාව විසින් , භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය වෙත වැලි ඉවත් කිරීම සඳහා ඉල්ලීම් කර වාර්ෂික බලපත්‍රයක් ලබා ගනිමින් ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කරන ලෙස උපදෙස් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br><br>කළමනාකරු ධීවර සංස්ථාව කිරින්ද<br><br>කැණීම් ඉංජිනේරු - භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය<br><br>සහකාර අධ්‍යක්ෂ වෙරළ හා පාරිසරික සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 5.7 | පසුගිය කාලය තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම් බෙදාදීම් සම්බන්ධව | දිස්ත්‍රික්කය තුළ දේශපාලනඥයින්ට සහ ඔවුන්ගේ ඥාතීන්හට රජයේ සහ මහවැලි ඉඩම් කැබලි ලබා දී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් ඊළඟ කමිටුවට ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දෙන ලදී. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>නේවාසික ව්‍යාපාර කළමණාකාර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 5.8 | ප්‍රාදේශීය සභා මට්ටමින් ග්‍රාමීය මාර්ග හා පාලම් ඉදිකිරීම | පළාත් සභා ආයතනවලට අයත් බොහෝ මාර්ග නඩත්තු කළ යුතු මට්ටමේ තිබෙන බවත්. ඒවා කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවක් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය.එසේම ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට නිමිත බවත් එක් ව්‍යාපෘතියක් සඳහා රු.ලක්ෂ 3 බැගින් වෙන් වී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | වෙන් වෙන් වශයෙන් ප්‍රාදේශීය සභාවන්හි පවතින ගැටළු සාකච්ඡා කිරීමෙන් අනතුරුව අදාළ ආයතන සම්බන්ධීකරණය කරගනිමින් කඩිනමින් ව්‍යාපෘති කටයුතු සිදුකරන ලෙස දැනුම් දෙන ලදී. | පළාත් පාලන සහකාර<br><br>අදාළ ප්‍රාදේශීය සභා ලේකම්වරුන් |
| 5.9 | පරිපාලන සංකීර්ණය ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ විදුලි පහන් සවි කිරීම සම්බන්ධව | මෙම ප්‍රදේශයේ වීදි ලාම්පු සවිකිරීම සම්බන්ධව ඇස්තමේන්තුවක් සකස් කර ආණ්ඩුකාරතුමන් වෙත ඉදිරිපත් කර ඇති බවත් ප්‍රධාන මාර්ගයේ විදුලි රැහැණක් නොමැති කම නිසා වීදි ලාම්පු සවිකිරීමට හැකියාවක් නොමැති බවත් , එම අවශ්‍යතාව සපුරා දෙන්නේ නම් වීදි ලාම්පු සවිකළ හැකි බවත් ඇස්තමේන්තුව අනුව පරිපාලන සංකීර්ණය අවට කි.මී. 2ක දුරක් සඳහා වීදි ලාම්පු 20ක් සවිකිරීමට සැලසුම් කර ඇති බවට කරුණු ඉදිරිපත් කරන ලදී. | අඩු සැර විදුලි මාර්ගයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් දළ ඇස්තමේන්තුවක් සති දෙකක් ඇතුළත ලබා දෙන ලෙසත්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ඉල්ලීම මත මෙම ක්‍රියාව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා | නාගරික කොමසාරිස් මහ නගර සභාව හම්බන්තොට<br><br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලංකා විදුලිබල මණ්ඩලය |

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



SCAN AnyScanner

| | | | | |
|---|---|---|---|---|
| | | වීදි ලාම්පු සඳහා විදුලි මාර්ගයක් ඉදිකිරීමට වැය වන වියදම අධික වීමත් එය පාරිභෝගිකයින් හට ගෙවීමට සිදුවන බැවින් විදුලි මාර්ගයක් ඉදි කල නොහැකි බවට කරුණු ඉදිරිපත් විය. මේ සඳහා සූර්යපැනල් භාවිතයට ගත හැකි නම් වඩාත් සාර්ථක බවත් , අඩු සැර විදුලි මාර්ගයක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපදන ලබා ගැනීමේ හැකියාවක් පවතින්නේ නම් මෙය ස්ථාපිත කිරීමට අවශ්‍ය තාක්ෂණය පවතින බවට අදහස් ඉදිරිපත් විය. | ගනීම සඳහා ලේකම් මගින් ඉල්ලීම් කිරීමට තීරණය කරන ලදී. | |
| | | තවද මෙම භූගත විදුලි රැහැන් පද්ධතිය නැවත සකස් කිරීම සඳහා ගාස්තු අයකිරීමකින් තොරව මාර්ග සංවර්ධන අධිකාරියට පැවරීම සම්බන්ධව කරුණු ඉදිරිපත් විය.<br>ඒ අනුව , වර්ෂ ආරම්භයේදීම මෙම කටයුත්ත සඳහා නඩත්තු වියදම් ලෙස අමතර ප්‍රතිපාදනයක් නගර සභාවට ලබා දෙන ලෙසට දකුණු පළාත්ප්‍රධාන අමාත්‍යංශයට යොමු කිරීම පිළිබඳව අදහස් ඉදිරිපත් විය. | ගාස්තු අය කිරීමකින් තොරව මෙම කොටස ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියට පැවරීමට කමිටුව යෝජනා කළ අතර එය නඩත්තු කර ගනිමින් ඉදිරියට කර ගෙන යාමට අදාළ ආයතන වෙත පැවරීමට තීරණය විය | ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය |
| 06 (1) | දිස්ත්‍රික්කය තුළ පවතින සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම | මෙම දිනවල ප්‍රධන රෝහල් 4ක් මූලික කරගනිමින් සිදුකරන ලද විශේෂ සමීක්ෂණයක ප්‍රතිඵල අනුව,<br>* හදිසි අනතුරු මගින් සිදුවී ඇති මරණ සංඛ්‍යාව - 80<br>- මාර්ග අනතුරු -19<br>- දියේ ගිලීම් -16<br>- වස පානය කිරීමෙන් - 14<br>- ඇදගෙන වැටීම් - 16<br>- ගෙල වැල දා ගැනීම්ම - 15<br>* බල්ලන් සපා කෑම - 6061<br>* පූසන් සපා කෑම් - 2795<br>* වෙනත් සතුන් මගින් සිදුවීඇති අනතුරු- 319<br>* දිස්ත්‍රික් මහ රෝහලෙහි ලියාපදිංචි තැලසීමියා රෝගීන් සංඛ්‍යාව - 26<br>යෞවන යෞවනියන් ඉලක්ක කරගනිමින් උපදේශන වැඩසටහන් මූලික කර "යොවුන් පියස" ව්‍යාපෘතිය මේ වන විට ආරම්භ කර ඇති බවත් ඉදිරියේදී සෑම රෝහලකම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බවත් පැහැදිලි කරන ලදි. | සෑම කමිටු රැස්වීමකදීම දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව වෙන් කිරීමට කමිටුව තීරණය කරන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 06 (2) | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම | දිස්ත්‍රික්කයේ පවතින මත්ද්‍රව්‍ය භාවිතය හා ආරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරන ලද අතර මත්ද්‍රව්‍ය භාවිතය ඉහළ යමින් පවතින බවත් ඒ සඳහා සෞඛ්‍ය අංශයේ සහ සියළු පාර්ශවයන්ගේ සහාය අවශ්‍ය බවත් සාකච්ඡා විය. | 2024 වර්ෂයට අදාළව මත්ද්‍රව්‍ය භාවිතයට අනුව හඳුනාගැනීම් මත විශේෂ තොරතුරු ඇතුලත් සවිස්තරාත්මක වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දෙන ලදී.<br><br>සෑම කමිටු රැස්වීමකදීම දිස්ත්‍රික්කයේ ආරක්ෂක තත්ත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව වෙන් කිරීමට කමිටුව තීරණය කරන ලදී. | ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



SCAN AnyScanner

| | | | | |
|---|---|---|---|---|
| 07 | මැටි කර්මාන්තකරුවන් මැටි ලබා ගැනීමේදී මුහුණපාන ගැටළු | හම්බන්තොට කැලියපුර ප්‍රදේශයේ මැටි කර්මාන්තයේ නියැලෙන පවුල් 54 ක් සිටින අතර නිෂ්පාදන කටයුතු සිදුකරන මෙම කාලය තුළ ඔවුන්ට මැටි ලබා ගැනීම සඳහා වනසංරක්ෂණ කලාපයට අදාල වෙහෙරගල නාගසිංහලන්ද වැව්තාවුල්ලෙහි කොටසින් මැටි ලබාගැනීමට අනුමැතිය ලබා දී ඇතත් වනසංරක්ෂණ නිලධාරීන්ගෙන් ඒ සඳහා බාධා පැමිණෙන බව දැනුම් දෙන ලදී. | මැටි කර්මාන්තයේ නියැලෙන පිරිසට පමණක් සීමාවන පරිදි අධීක්ෂණයකින් හා පසුවිපරමකින් මැටි ලබා ගැනීමට අවසර ලබා දෙන ලෙසත් පරිසර හානියකින් තොරව කටයුතු කිරීමට වගබලා ගන්නා ලෙසත් දැනුම් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ, වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 08 | වන අලි කළමනාකරණ ගැටළු | 2025.02.26 දින පළාත් සභා හා පළාත් පාලන ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අදාළ පාර්ශව සමඟ මෙම ගැටළුව සම්බන්ධව වෙනමම සාකච්ඡා කළ බවත් , වනජීවී දෙපාර්තමේන්තුව සඳහා ප්‍රමාණවත් වාහන පහසුකම් නොමැති බැවින් කඩිනම් අවශ්‍යතාවයක් ලෙස සලකා ජන ජීවිත වලට විය හැකි මරණීය හානි හා දේපල හානි අවම කර ගැනීම උදෙසා ඔවුන්ගේ ඉල්ලීම පරිදි දැනටමත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන දෙකක් ඉන්ධන සහිතව ඔවුන් වෙත ලබා දී ඇති බවටත් කමිටුව වෙත දැනුම් දෙන ලදී. | | |

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තූතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු 1.30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

2025 මාර්තු මස ..07..................
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.



SCAN AnyScanner